# මැයි එකොලහ කළුවර රෑ - අවසාන කොටස



.................මෙම චිත්‍රය වනාහී අන් කිසිවක් නොව එවකට සාමය සහ මානව අයිතිවාසිකම් පිළිබඳ ප්‍රචාරක කටයුතු වලදී ජාත්‍යන්තර ක්ෂමා සංවිධානය පවා භාවිතා කළ, කූඩුවක සිරකළ පරවියෙකු ගේ චිත්‍රයයි. කූඩුව තුල හෝ පරවියාට ඉගිළෙන්නට නොහැකිවන ලෙස උගේ පාද යදමකින් විශාල යකඩ බෝලයකට සවිකර තිබේ. බාලසූරියන් මේ මුල් පිටුව සහිත සඟරාවේ සම සංස්කාරකයෙකු විය. මෙයට අමතරව ඒ වන විට කවියකු ලෙස ද තරමක ප්‍රසිද්ධියක් ලබා සිටි බාලසූරියන්, මේ ලිපි ලේඛන නිසාම කොටියෙකු බවට පත්විය. ඒ අපේ තාත්තලාගේ කාලයේ ඕනෑම නිදහස් සමාජ සංශෝධන මතධාරියෙකු සමසමාජ කාරයෙකු ද, අපේ කාලයේ එවැන්නෙකු ජේ.වී.පී කාරයෙකු වූවා සේමය.

මෙම ලිපියේ මුල් කොටසින් මා ඔබට කියූ කතාවේ සාරාංශය නම්: සුන්දර පේරාදෙනි සරසවිය අසුන්දර කරමින්, බුද්ධිමතුන් පරයා මන්ද බුද්ධික ලා ද, සිංහයින් පරයා සිගාලයින් ද රජ වූ 1983 මැයි 11 දින රාත්‍රියේ දී, ඉන් දෙමසකට පසු එලැඹීමට නියමිත කූප්‍රකට කළු ජූලියට පුරෝධාවකයක් සේ වෙමින්, සිංහල සිසුන් පිරිසක් විසින් දෙමල සිසුන් පිරිසකට පහර දුන් බව සහ තම ආරක්ෂාව පතා දෙමල සිසුන් ගම් බිම් කරා ගිය බවත් ය. මේ තිරශ්චීන සිදුවීම පිළිබඳව පසුව එළිදරව් වුනු කරුණු කිහිපයක් අද ඔබ හමුවේ දැක්වීමට මම අදහස් කරමි.

මේ දිනවල දෙවන වසරේ ඉගෙනුම ලබමින් සිටි සිසුන් වන අපට විශ්ව විද්‍යාලය තුල නේවාසික පහසුකම නොලැබුනු නිසා අප නැවතී සිටියේ ඊරියගම නිවෙසකය. පසුද, එනම් මැයි 12 ද, උදේ වරුවේ සුපුරුදු පරිදි විශ්ව විද්‍යාලය කරා පැමිණි අපට පෙර දින රාත්‍රී සිදුවීම මාලාව සහ උද්ගත වී ඇති තත්වය සැකෙවින් දැන ගැනීමට ලැබුනි. ඉංජිණේරු පීඨයේ දෙමල සිසුන් විශාල ප්‍රමාණයක් නිවෙස් බලා පිටත්ව ගොස් හෝ පිටත්ව යමින් සිටියහ.

ඉංජිනේරු පීඨ ශිෂ්‍ය සංගමයේ දූරදර්ශී නායකත්වය යටතේ වහා රැස් වූ ශිෂ්‍යයෝ, විශ්ව විද්‍යාලයේ ආරක්ෂාකාරී තත්වයක් උදවී, තම සහෝදර දෙමල සිසුන් ආපසු පැමිණෙන තුරු සියළු අධ්‍යයන කටයුතුවලින් ඉවත්ව සිටීමට තීරණය කළහ. අපට සති තුනක පමණ අනියම් නිවාඩුවක් ලැබුනි. මේ කාලයේ දී, අපේ ආචාර්ය මණ්ඩලයේ ද ආශිර්වාදය මේ තීරණයට ලැබුණු බව සඳහන් කළ යුතුය.

එය එසේ වූවද, විශ්ව විද්‍යාලයේ ඇතැම් ආචාර්යවරුන්, විශේෂයෙන්ම මැයි 11 දින, ඊට පෙර හා පසු දින කිහිපය තුල ක්‍රියාකර ඇත්තේ මීට හාත්පසින්ම වෙනස් ආකාරයකට බව මේ සිද්ධින් ඇසින් දුටු සාක්ෂිවලට අනුව පැහැදිලි වේ. දෙමල සිසුන් ට පහර දීම එක්තරා අහඹු සිදුවීමක් නොව යම් මට්ටමක දී සැලසුම් කර මනා ලෙස මුදහරින ලද්දක් බව ද ඔවුන් ඒ පහරදීම් සැළසුම් හෝ පහරදීම් පිළිබඳව හෝ කලින් දැනුවත්ව සිට ඇති බවට ද සැක ඇතිවේ. මුල් දිනයේ පහර දීමෙන් නොනැවතී, මැයි 12 සහ 13 දෙදින රාත්‍රී කාලවල දී ද විශ්ව විද්‍යාලයෙන් බැහැර නොවී සිටි දෙමල උපදේශකවරුන් කිහිප දෙනෙකුට පහර දීමට ද, මුල් දිනයේ පහරදීම් මෙහෙය වූ මැර සිසු නායකයින් ට ඉඩ ලැබුනේ ද මේ වගකිව යුතු ආචාර්යවරුන් ගේ ක්‍රියාකාරකම් හෝ ක්‍රියාවිරහිතභාවය නිසා ය.

මගේ මේ සටහනේ ඇතුලත් සිද්ධීන් පිළිබඳ විස්තර සඳහා පාදක වන්නේ මානව හිමිකම් පිළිබඳ විශ්ව විද්‍යාල ආචාර්යවරුන් ගේ (යාපනය) සංගමය විසින් ප්‍රකාශයට පත් කර ඇති විවිධ වාර්තාවේ. මැයි 11 රෑ පහරදීම් පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ හිල්ඩා ඔබේසේකර ශාලාවේ ද, ජේම්ස් පීරිස් ශාලාවේ ද, මාර්ස් ශාලාවේ ද එකම කාල පරාසයක දී ඇරඹිණ. හිල්ඩා ශාලාවේ දී මුලින්ම පහර දීමට ලක්වූවේ බාලසූරියන් නම් ඉංජිනේරු පීඨ පලමු වසරේ සිසුවෙකි. යකඩ පයිප්ප කැබලි සහ පුටු කකුල් වලින් සන්නද්ධ වූ සිංහල මැර සිසු පිරිසක් එදින රාත්‍රියේ ඔහු සොයා පැමිණියහ. පසුව ඔහුට පවසන ලද පරිදි ඔහුට විරුද්ධව තිබූ චෝදනාව වූයේ දෙමල භාෂාවෙන් මුද්‍රිත විවිධ පොත් පත්‍රිකා ඔහුට තැපෑලෙන් පැමිණීමයි. එනිසාම ඔහු එල්.ටී.ටී.ඊ. සැකකරුවෙක් විය. විශේෂයෙන්ම හිල්ඩා ඔබේසේකර ශාලාවේ එවකට ශාලාධිපති ධූරය දැරූ ආචාර්යවරයාට නම්, ඒ එක් සඟරාවක මුල් පිටුව සැරසූ චිත්‍රය ම බාලසූරියන් ගේ ත්‍රස්තවාදීකම ගැන තීරණාත්මක සාධකයක් විය. මෙම චිත්‍රය වනාහී අන් කිසිවක් නොව එවකට සාමය සහ මානව අයිතිවාසිකම් පිළිබඳ ප්‍රචාරක කටයුතු වලදී ජාත්‍යන්තර ක්ෂමා සංවිධානය පවා භාවිතා කළ, කූඩුවක සිරකළ පරවියෙකු ගේ චිත්‍රයයි. කූඩුව තුල හෝ පරවියාට ඉගිළෙන්නට නොහැකිවන ලෙස උගේ පාද යදමකින් විශාල යකඩ බෝලයකට සවිකර තිබේ. බාලසූරියන් මේ මුල් පිටුව සහිත සඟරාවේ සම සංස්කාරකයෙකු විය. මෙයට අමතරව ඒ වන විට කවියකු ලෙස ද තරමක ප්‍රසිද්ධියක් ලබා සිටි බාලසූරියන්, මේ ලිපි ලේඛන නිසාම කොටියෙකු බවට පත්විය. ඒ අපේ තාත්තලාගේ කාලයේ ඕනෑම නිදහස් සමාජ සංශෝධන මතධාරියෙකු සමසමාජ කාරයෙකු ද, අපේ කාලයේ එවැන්නෙකු ජේ.වී.පී කාරයෙකු වූවා සේමය. මෙහි උත්ප්‍රාසජනක සත්‍යය නම්, එවකට එල්.ටී.ටී.ඊ. යනාදී සන්නද්ධ සංවිධාන අනුගමනය කළ ක්‍රියාපටිපාටියට ප්‍රතිවිරුද්ධ වාමාංශික අදහස් දැරූ බාලසූරියන්, පසුව ජූලි කලබල වලින් පසු සිය ඉගෙනීම් කටයුතු තාවකාලිකව නැවතුනු කාලයේ දී පවා එකතු වූයේ වාමංශික දේශපාලනමය සංවිධානයකට වීමයි.

මැර සිසු නායකයින් සහ ඔවුන් ගේ උසි ගැන්වීමට අවනතවූ කණ්ඩායම පුටු කකුල් යනාදියෙන් බාලසූරියන් ට සෑහෙන වෙලාවක් පහර දුන් පසු, ඔහු වෙත පැමිණි ශාලාධිපති ධර්මදස ඔහුව කාර්යාලය ට රැගෙන ගොස් ඇත. බාලසූරියන් ට තැපෑලෙන් පැමිණි සහ ඔහුගේ කාමරයේ තිබූ පත්‍රිකා, සඟරා යනාදියේ චිත්‍ර සහ කාටූන් පමණක් (මේ සඟරා යනාදිය දෙමල භාෂාවෙන් පල වූ ඒවාය) ඒවන විටත් අධ්‍යයනය කර සිටි ධර්මදස, උප කුලපති ගේ ද අනුදැනුම ඇතුව පොලිසියට බාර දුන්නේය. මෙම ප්‍රකාශන රහස් ප්‍රකාශන නොව ප්‍රසිද්ධ ප්‍රකාශන බවත් දෙමල කියවීම දන්නා සහ බාලසූරියන් ව සඟරා සංස්කාරකවරයෙක් සහ කවියෙක් ලෙස හඳුනන සිවසේකරම් ඇතුළු විශ්ව විද්‍යාල මහාචාර්යවරුන් ගේ ඉල්ලීම් ද නොතැකුණි. පහර කා සිටි බාලසූරියන්, පොලිසියේ ද, කූප්‍රකට හතරවන තට්ටුවේ ද සංග්‍රහ දින දෙකක් විඳ චෝදනා විරහිතව නිවෙසට ගියේ ය.

මෙම පහරදීම් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය වාතාවරණය සැකසීම සඳහා මැර සිසුවන් විසින් මුලින් ම උපයෝගී කොට ගත්තේ අපූරු නිමිත්තකි. මැයි 11 දින සවස් වරුවේ විශ්ව විද්‍යාලයට ඇතුළුවන ප්‍රධාන මාර්ගය අසල පිහිටුවා තිබූ පුවරුවේ සිංහල අකුරු උඩින් සිමෙන්ති වැනි උකු දියරයක් ගා තිබුනි. මෙය දෙමල සිසුන් විසින් කරන ලද්දක් බවත්, ඔවුන් ට හොඳ පාඩමක් ඉගැන්විය යුතු බවත් මැර සිසු නායකයින් විසින් ප්‍රචාරය කරන ලදී. සරදමකට මෙන්, මෙය 1956 ශ්‍රී අකුරේ තාර ගෑ බවට සිදු කල ප්‍රචාර සහ ඉන් අනතුරුව මුදහළ ප්‍රචණ්ඩත්වය සිහි ගන්වයි.

මා මුලින් සඳහන් කළ පරිදි මැයි 11 රාත්‍රියේ දී, නේවාසිකාගාර තුනක දී දෙමල සිසුන්ට පහර දෙන ලදී. විශ්ව විද්‍යාල බලධරයන් ගේ උදාසීනත්වය මෙම සිදුවීම් වලට වක්‍රාකාර අනුබලයක් දුන් අතර එය වඩාත් පැහැදිලි වන්නේ නිවෙස් කරා නොගොස් විශ්ව විද්‍යාල නේවාසිකාගාරවල තනිකඩ ආචාර්යවරුන් සඳහා ඇති කාමරවල නැවතී සිටි ආචාර්ය මණ්ඩලයේ තිදෙනෙකුට 12 ද රාත්‍රියේ පහර දීමත්, ඉන් පසුද විශ්ව විද්‍යාලයෙන් බාහිරව පිහිටා තිබෙන රෝහලේ දී ද මෙවැනි පහර දීම් සිදුවීමත් හේතුවෙනි. විද්‍යා පීඨයේ අවසන් වසර සිසුන් වූ, ප්‍රධාන මැර නායකයින් දෙදෙනා ගේ ශිෂ්‍ය භාවය තාවකාලිකව අත්හිටුවීම පවා සිදුවූයේ මේ ප්‍රධාන පහරදීමෙන් සති තුනකටත් වඩා ගතවී, ඒ වන විට නැවත අධ්‍යයන කටයුතු සඳහා විශ්ව විද්‍යාලයට පැමිණ සිටි දෙමල සිසුන් පිරිසකට මුහුණු ආවරණය කරගත් පිරිසක් විසින් පහර දීමෙන් ද පසුවය.

මේ පහරදීම් ගැන සොයන්නට සුපුරුදු පරිදි කමිටුවක් පත්කරන ලදී. කෙනත් ලැනරෝල් ගේ සභාපතිත්වයෙන් සහ කල්නායිඩු හා ඒකනායක ගේ සාමාජිකත්වයෙන් සැදුම් ලත් කමිටු වාර්තාව කියවූ පිරිස ගේ ප්‍රසංශාවට ලක්වුන ද විශ්ව විද්‍යාල බලධාරීන් විසින් කිසි දිනක ප්‍රසිද්ධියේ එළිදක්වන නොලදී. මෙම වාර්තාව උපුටා දක්වන මානව හිමිකම් පිළිබඳ විශ්ව විද්‍යාල ආචාර්යවරුන් ගේ වාර්තාව පවසන්නේ පේරාදෙනියේ මේ සිදුවීම් මාලාව හුදෙකලා අහඹු සිදුවීමක් නොව රටේ දේශපාලන අවශ්‍යතාවයක් මත පෙලගැස්වුනු එකක් බවයි. ලැනරෝල් වාර්තාවෙන් නම් කල මැරයන් සහ මැර සිසුවන් 18 ක් දෙනාට ලබා දුන් දඬුවමක් නම් මගේ මතකයේ නැත. මෙයින් වැඩි දෙනා රටේ පාලක දේශපාලන පක්ෂයට කෙලින්ම හෝ අනියම් ව හෝ සම්බන්ධතා තිබුනු අය බව ද කියවේ. මේ පිරිසෙන් 17 දෙනෙක් ම වෛද්‍ය, දන්ත වෛද්‍ය, පශු වෛද්‍ය සහ විද්‍යා සිසුන් වීම ද විශේෂයකි. විශ්ව විද්‍යාල උගතුන් ගේ බුද්ධිමත් කම ගැන තවත් අවශ්‍ය කවර නම් සාධක ද? එක් මැර නායකයෙක් පසු කලෙක අයින්ස්ටයින් ගේ සාපේක්ෂතාවාදය ගැන විශ්ව විද්‍යාල දේශකයෙක් විය. උගත්කම හා බුද්ධිමත්කම අතර ඇති හීන සහසම්බන්ධතාවය ගැන ඔහු හොඳම උදාහරණයැයි මම සිතමි.

කම්මල යැයි ආදරයෙන් හැඳින්වුනු මා උගත් පේරාදෙනිය ඉංජිනේරු පීඨයේ තෝතැන්න වූයේ අපේ කලා කවයේ බිත්ති සඟරාවයි. මැයි 11 කළුවර රැයෙන් ටික දිනකට පසුව එහි පලවූ කවකින් කියවුනේ එවර විශ්ව විද්‍යාලයේ වෙසක් සැරසිලි වලින් ඉස්මතු වන නව අරුතක් ගැනයි. වෙනත් රටක වෙනත් ජාතිකයෙකු වූ බුදුන් ගේ ලේ වෙනත් පාටක් දැයි එමගින් අසා තිබුනේ ජාතිවාදයේ නිෂ්ඵල බව කියා පෑමටය. මෙම නිසඳැස් කවීය හෙන්රි වර්ණකුලසූරිය ගේ නිර්මාණයක් විය. අපේ පීඨයේම අඩු වශයෙන් එක් අයෙක් මෙයින් කිපුණි. ඔහු ඊලග කලාපයට පිලිතුරක් එවීය. එය පිලිතුරකටත් වඩා වස් කවියක් බව සමහරෙකු ගේ අදහස විය. ශිෂ්‍ය සටන්, උපවාස සහ ප්‍රාණ ඇපකරුවන් මැද විශ්ව විද්‍යාලය වැසී ගියෙන් කවි සටන එයින් නැවතුනි.

ඉන් පසුව එලැඹියේ කූප්‍රකට කළු ජූලියයි!

ර. චන්ද්‍රසූරිය

ra.chandra.suriya@gmail.com

නැවුම් පුවත් හරවත් කතා බහ
දෙස් විදෙස් කාලීන සිද්ධීන් මියුරු සංගීතය

ලක් හඬ FM 97

සෑම ඉරිදාවකම
(දහවල් 10.00 සිට 12.00 දක්වා)

ඔබේ හඬ - ලක් හඬ